**CATHOLIC BISHOPS' CONFERENCE IN SRI LANKA**

Lankarama, 19, Balcombe Place, Colombo - 08, Sri Lanka.

Tel. No : 0094-11- 2697062 / 2697110
Fax.No : 0094-11- 2699619
E-mail : EpiscopalSL@gmail.com


# වැදගත් කාරණා කිහිපයක් පිළිබඳ
# ශ්‍රී ලංකා කතෝලික රදගුරු සමුළුවේ ප්‍රකාශනය

අප දේශයේ යුක්තිය, සාමය සහ සංහිඳියාව කෙරෙහි සෘජුවම බලපාන වැදගත් කරුණු කිහිපයක් පිළිබඳව 2026 අගෝස්තු 18 සිට 20 දක්වා පැවති ශ්‍රී ලංකා කතෝලික සමුළුවේ පූර්ණ සැසිවාරයේ දී අවධානය යොමු කෙරිණි.

සමාජය තුළ සමානාත්මතාවය සහ යුක්තිය ප්‍රවර්ධනය කිරීම සඳහා රජය විසින් මෑතක දී ගන්නා ලද ඇතැම් පියවර රදගුරු හිමිවරුන්ගේ ඇගැයීමට ලක්විය. එම පියවර අතරවන මන්නාරමේ යෝජිත සුළං විදුලි බලාගාර කෙරෙහි විශේෂ අවධානයක් යොමු විය. සුළං විදුලි බලාගාර දහහතරක් ස්ථාපිත කර ඇති අතර, පොරොන්දු වූ පරිදි මෙවැනි බලාගාර තව දුරටත් පුළුල් කිරීමක් සිදු නොකෙරේ.

තේ වතු සේවකයින්ගේ වැටුප් වැඩිවීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා කතෝලික රදගුරු සමුළුව රජයට සිය ස්තුතිය පළ කරන්නේය. ශ්‍රී ලංකා කතෝලික රදගුරු සමුළුව විසින් පසුගිය වසරේ අගෝස්තු මාසයේ දී මෙම අවශ්‍යතාවය, අතිගරු ජනාධිපතිතුමන් වෙත ඉදිරිපත් කර ලදී. එය දිගු කාලීන අවශ්‍යතාවක් වූ අතර, රටේ ආර්ථිකය ප්‍රවර්ධනය කිරීම සඳහා බෙහෙවින් උපකාරී වන මෙම සමාජ කණ්ඩායම සඳහා වන වැටුප් වැඩිවීම ශ්‍රී ලංකා කතෝලික රදගුරු සමුළුව අගය කරන්නේය.

ඉහත කී තීරණ ශ්‍රී ලංකා කතෝලික රදගුරු සමුළුව අගය කරන අතරම, යාපනය අර්ධද්වීපයේ සමූහ මිනීවළවල් පිළිබඳ ගැටළුව සම්බන්ධයෙන් අපක්ෂපාතී විමර්ශනයක් පැවැත්වීමේ අවශ්‍යතාවය ශ්‍රී ලංකා කතෝලික රදගුරු සමුළුව අවධාරණය කරයි. දීර්ඝ කාලයක් පුරා සිදුවෙමින් පවතින චෙම්මණි කැණීම් සම්පූර්ණ විය යුතුය. චෙම්මණි හා සම්බන්ධ යැයි පැවසෙන අපරාධ සම්බන්ධයෙන් සත්‍යය සහ වගවීම සහතික කිරීම සඳහා මෙම ප්‍රයත්නය අවශ්‍ය වේ.

ඒ හා සමානවම, වසර 30 කට ආසන්න කාලයක් පුරා දිග්ගැස්සුනු සිවිල් යුද්ධය අතරතුර සිදුවූ ත්‍රස්තවාදී සහ සමූහ මිනිස් ඝාතන පිළිබඳ වෙනත් අතුරු කථා සහ එම කාල පරිච්ඡේදයට පෙර යුගයේ අත්විඳින ලද ත්‍රස්තවාදී ක්‍රියාවන් ද ඇත.

වැලි කැණීම් කටයුතු ද හේතුවෙන් මන්නාරම් දූපතේ සිදුවන විශාල පාරිසරික හානිය පිළිබඳව ද ශ්‍රීලංකා කතෝලික රදගුරු සමුළුවේ අවධානය යොමු ව තිබේ. පාරිසරික වශයෙන් හානිදයක මෙම ක්‍රියාකාරකම් හේතුවෙන් ජනතාව කලබලයට පත්ව ඇති අතර, ඉන්ධන සහ ගෑස් ගවේෂණය සඳහා මන්නාරම් දූපත අවට බිම් කැණීම් පිළිබඳව ද ශ්‍රී ලංකා කතෝලික රදගුරු සමුළුව වෙත තොරතුරු ලැබී තිබේ.

මෙම ක්‍රියාකාරකම් ආර්ථික සංවර්ධනය සඳහා වන ධනාත්මක මුලපිරීම් විය හැකිය. එසේ වුවත්, නිසි පාරිසරික තක්සේරු කිරීම් විනිවිද භාවයෙන් යුතුව සිදු කිරීම සහ මෙවැනි ව්‍යාපෘතීන් පිළිබඳව ජනතාව දැනුවත් කිරීම වගකිවයුත්තන්ගේ යුතුකමකි. එවැනි සංවර්ධන කටයුත්තකට පෙර, ප්‍රදේශයේ ජනතා මතය තහවුරු කර ගැනීම සඳහා නිසි මත විමසුමක් පැවැත්විය යුතුය. ජනතාවගේ අයිතිවාසිකම් සහ ගරුත්වය ආරක්ෂාවීම සඳහා එවැනි ක්‍රියාකාරකම් මගින් මන්නාරම් දූපතේ ධීවර ප්‍රජාවගේ ජීවනෝපායට සහ ජල සම්පතට බලපෑමක් ඇති නොවිය යුතුය.

# CATHOLIC BISHOPS' CONFERENCE IN SRI LANKA

Lankarama, 19, Balcombe Place, Colombo - 08, Sri Lanka.

Tel. No : 0094-11- 2697062 / 2697110
Fax.No : 0094-11- 2699619
E-mail : EpiscopalSL@gmail.com


එක්ස්ප්‍රස් පර්ල් නෞකාවෙන් සිදු වූ පාරිසරික හානිය සහ ඒ සඳහා වන්දි ගෙවීම පිළිබඳ අධිකරණ තීන්දුව ක්‍රියාත්මක කිරීම පිළිබඳව ද ශ්‍රී ලංකා කතෝලික රදගුරු සමුළුව තව දුරටත් සැලකිලිමත් වන්නේය. වර්තමානයේ සිදුවන මුතුරාජවෙල තෙත්බිම ගොඩකිරීම හේතුවෙන් සිදුවන පාරිසරික උපද්‍රවයන් පිළිබඳව අවධානය යොමු කළ යුතු අතර, අනතුරුදායක සංවර්ධන සැලසුම්වලට එරෙහිව මුතුරාජවෙල තෙත් බිමේ සංරක්ෂණය සහතික කිරීම සඳහා අවශ්‍ය පියවර ගත යුතුය.

අති උතුම් හැරල්ඩ් ඇන්තනි පෙරේරා හිමිපාණෝ
සභාපති - ශ්‍රී ලංකා කතෝලික රදගුරු සමුළුව
කුරුණෑගල රදගුරු

අති උතුම් ඇන්ටන් රංජිත් හිමිපාණෝ
මහා ලේකම් - ශ්‍රී ලංකා කතෝලික රදගුරු සමුළුව
යාපනය රදගුරු
මඩකළපුව පදවි අපෝස්තලික පරිපාලක

අති උතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණෝ
කොළඹ අගරදගුරු

අති උතුම් නොයෙල් එම්මානුවෙල් හිමිපාණෝ
උප සභාපති - ශ්‍රී ලංකා කතෝලික රදගුරු සමුළුව
ත්‍රිකුණාමලය රදගුරු

අති උතුම් වැලන්ස් මෙන්ඩිස් හිමිපාණෝ
මහනුවර රදගුරු

අති උතුම් රේමන්ඩ් වික්‍රමසිංහ හිමිපාණෝ
ගාල්ල රදගුරු

අති උතුම් ජුඩ් නිශාන්ත සිල්වා හිමිපාණෝ
බදුල්ල රදගුරු

අති උතුම් විමල් සිරි ජයසූරිය හිමිපාණෝ
හලාවත රදගුරු

අති උතුම් ඇන්ටන් වයමන් ක්‍රෑස් හිමිපාණෝ
රත්නපුර රදගුරු

අති උතුම් අන්තෝනිපිල්ලෙයි ඥානප්‍රගාසම් හිමිපාණෝ
මන්නාරම රදගුරු

අති උතුම් සාගර ජයමාන්න දි.ස.නි. හිමිපාණෝ
අනුරාධපුර රදගුරු

අති උතුම් මැක්ස්වල් සිල්වා හිමිපාණෝ
කොළඹ සහයක රදගුරු

අති උතුම් ජේ. ඩී. ඇන්තනි ජයකොඩි හිමිපාණෝ
කොළඹ සහයක රදගුරු

2026 සැප්තැම්බර් මස 10 වැනි බ්‍රහස්පතින්දා